# ශ්‍රී ලංකාවේ
# විසම්මුතිය මර්දනය

**නව ජනාධිපතිවරයාගේ පළමු දින සියය**

2015 ජනවාරි 09 - අප්‍රේල් 19



1990 පෙබරවාරි 18 වන දින පොලීසිය විසින් පැහැරගෙන ගොස් ඝාතනය කළ ප්‍රකට ජනමාධ්‍යවේදී රිචඩ් ද සොයිසා පිළිබඳ නිෂ්පාදනය කිරීමට නියමිත වූ චිත්‍රපටය සඳහා රජය සහයෝගයක් පෙන්වා නැහැ ( ඡායාරූපය:අන්තර්ජාලය)


INFORM
Human Rights Documentation Centre
www.ihrdc.wordpress.com informcolombo@gmail.com

අන්තර්ගතය


1. ආරක්ෂක හමුදා විසින් බ්‍රිතාන්‍ය අමාත්‍ය වරයා සමග කතා බහ නොකරන ලෙසට අවතැන් වූ පුද්ගලයන්ට තර්ජනය කරයි.
2. දිනපතා දෙමළ පුවත්පතක් බෙදාහරින්නෙකු ට ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවේ නිධාරීන්ගෙන් මරණ තර්ජන
3. ජනමාධ්‍යවේදීන් තිදෙනෙකුට බිය වැද්දවීම්
4. අසත්‍ය තොරතුරු සහිත ලිපියක් ලියූ බවට චෝදනා කරමින් දෙමල ජනමාධ්‍යවේදියෙක් අත්අඩංගුවට
5. **රාජපක්ෂ ආධාරකරුවන්ගෙන් පත්‍රිකා බෙදා හැරීමට බාධා, ක්‍රියාකාරීන්ට ප්‍රහාර**
6. එක් රූපවාහිනී කණ්ඩායමක් තවත් රූපවාහිනී කණ්ඩයමක් විසින් රඳවාගෙන හිරිහැර කළ බවට චෝදනා
7. චෝදනා රහිතව දින 362ක් රැඳවුම් භාරයේ සිට නිදහස් වූ මානව හිමිකම් ක්‍රියාකාරිනිය ට අධිකරණය සීම පනවයි.
8. චැනල් 4 වෙත සහය පළ කළැයි විදේශ ගමන් බලපත්‍රය අත් හිටුවයි
9. සැක සහිත ගනුදෙනුවක් යට ගැසීමට මාධ්‍යවේදියෙකුට පහරදෙයි
10. වවුනියාව පුරවැසි කමිටුවේ ප්‍රධානියා ත්‍රස්ත විමර්ශනයට කැදවයි
11. ඝාතනය කෙරුණු ජනමාධ්‍ය වේදියෙකු වන රිචඩ් ද සොයිසා පිළිබද නිර්මාණය වූ චිත්‍රපටයක් අත්හිටුවයි.
12. මානව හිමිකම් ආරක්ෂකයෙකු වෙත පනවා තිබූ සීමා ඉවත් කිරීම ප්‍රතික්ෂේප වේ
13. පොලීසියට විරුද්ධව විරෝධතාවයේ නිරත වූවන්ට කඳුළු ගෑස් ප්‍රහාර
14. විශ්ව විද්‍යාල ශිෂයන්ගේ විරෝධතා ව්‍යාපාරයකට පෙලීසියෙන් ප්‍රහාර
15. ක්‍රියාකාරී හිමි නමකට පොලීසියෙන් හිරිහැර


*ඉන්ෆෝම් ආයතනය 1990 දී ආරම්භ කරන ලද්දේ විශේෂයෙන්ම වාර්ගික ගැටුම සහ යුද්ධය සන්දර්භයෙ හි ශ්‍රී ලංකා වේ මානව හිමිකම් තත්ත්වය නිරීක්ෂණය කරමින් කරුණු ගොනු කිරීමටත් එම කරුණු ලිඛිත සහ වාචික මැදිහත් වීම් හරහා ප්‍රාදේශීයව, ජාතිකව සහ ජාත්‍යන්තරව වාර්තා කිරීමටත්ය. එසේම සිය අයිතීන් නිරන්තරයෙන් සහ ක්‍රමවත් ලෙස කෙලෙසීමට ලක්වන අනෙක්ජන ප්‍රජාවන් සමග ද ඉන්ෆෝම් ආයතනය කටයුතු කරයි. වර්තමානයේදී ඉන්ෆෝම් ආයතනය මැතිවරණ නිරීක්ෂණය,මාධ්‍ය නිදහස සහ මානව හිමිකම් ආරක්ෂකයින් සම්බන්ධයෙන් සිය අවධානය යොමු කර තිබේ. ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය දේශීය ක්‍රියාධරයින්, කණ්ඩායම් සහ ජාලයන් සමඟ මෙන්ම කලාපීය සහ ජාතයන්තර මානව හිමිකම් ජාලයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.*

## සාරාංශය:

2014 රාජපක්ෂ පාලනය සමග සංසංදනය කරන විට, මෛත්‍රී පාලනයේ පළමු දින 100 තුළ විකල්ප අදහස් වලට එල්ල වූ ප්‍රහාර වල ඇති තීව්‍ර තාවය, ප්‍රහාර, තර්ජනය කිරීම් සහ බිය ගැනිවීම් සංඛ්‍යාව, පහළ ගොස් ඇති බව පෙනී යයි. කෙසේ වුවත්, රාජපක්ෂ පාලන කාලය තුළ වාර්තා වූ සිදුවීම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම ඉතාම මන්ද ගාමී ස්වරූපයක් තිබූ බව පෙනී යන අතර අවස්ථා කිහිපයකදීම විපක්ප අදහස් වලට ප්‍රහාර එල්ල විය.

පොලිස් රැඳවුම් භාරයේ සිටි පුද්ගලයෙකු මිය යාමේ සිදුවීමක් හෙලා දැකීම සඳහා තලවකැලේ පොලීසිය ඉදිරිපිටට රැස්වූ පිරිස විසුරුවා හැරීමට ප්‍රචණ්ඩ ලෙස කඳුළු ගෑස් යොදා ගත් බවට තලවකැලේ පොලීසියට චෝදනා එල්ල විය. පෙබරවාරි 19 වන දින කොළඹදී පත්‍රිකා බෙදා හරිමින් සිටි සිවිල් සහ දේශපාලන ක්‍රියාකාරීන් පිරිසකට රාජපක්ෂ ආධාරකරුවන්ගෙන් සැදුම් ලත් ජාතික නිදහස් පෙරමුණේ සාමාජිකයන් විසින් පහර දෙන ලදී. ප්‍රජාතන්ත්‍රවාදී ජනතා මණ්ඩලයේ සාමාජිකයන් විසින් 'යක්ෂාගමනයට පෙර විමල් වීරවංසට සහ වාසුදේවට ප්‍රශ්න 10ක්' යන හිසින් යුතු මෙම පත්‍රිකාව බෙදා හරිමින් සිටියෙදී මෙම පහර දීම එල්ල වී ඇත. මාර්තු 31 වන දින අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ විරෝධතාවයකට පොලීසිය සහ පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් ප්‍රහාර දෙන ලදී. එහිදී තුවාල ලැබූ ශිෂ්‍යයන් රෝහල් ගත කෙරුණි. නිෂ්පාදනයට නියමිත චිත්‍රපටයේ පාදක කතාව නුසුදුසු එකක් වන බවත් එය අප්‍රසන්න අතීතය සිහි ගන්වන බවත් දක්වමින් චිත්‍රපටය රූගත කිරීමට අවසර ලබා දිය නොහැකි බව සාතනය කෙරුණු මාධ්‍යවේදී රිචඩ් ද සොයිසා පිළිබඳ නිර්මාණය වූ චිත්‍රපටයේ අධ්‍යක්ෂවරයා වෙත ආරක්ෂක අමාත්‍යංශය විසින් දැනුම් දෙන ලදී.

බ්‍රිතාන්‍ය විදෙශ කටයුතු සහ පොදුරාජ්‍ය මණ්ඩල කටයුතු පිළිබඳ අමාත්‍ය හියුලේ ස්වරයර් සමග සිය ජීවන තත්ත්වය පිළිබඳ සාකච්ඡා නොකරන මෙන් අධි ආරක්ෂිත කළාපයේ තාවකාලිකව ජීවත් වන අවතැන් වූ පුද්ගලයන් වෙත සිවිල් ඇඳුමින් සැරසුණු ආරක්ෂක හමුදා නිලධාරීන් අනතුරු හඟවා ඇති බව වාර්තා විය. දෙමල ජාතික ජනතා පෙරමුණට (Tamil National People's Front – TNPF) සහය දක්වන ඉතු නාම් තේසාම් නැමති දිනපතා පළ වන දෙමල පුවත් පතේ බෙදාහරින්නෙක් වෙත ශ්‍රී ලංකා යුධ හමුදාවේ බුද්ධි අංශ නිලධාරීන් විසින් තර්ජනය කර ඇත. උතුරින් වාර්තා වූ තවත් ප්‍රවෘතියකට අනුව නිල ඇඳුම් උඩු කය ලා ගත් බීමත් පොලිස් නිලධාරීන් විසින් ජනමාධ්‍යවේදීන් තිදෙනෙකු නවත්වා පිහියක් පෙන්වා තර්ජනය කර ඔවුන් පසු පස හඹා ගෙස් ඇත. ඉතිහාසයේ පළමු වතාවට ප්‍රවෘතියක් සඳහා සාවද්‍ය තොරතුරු සැපයීම යන චෝදනාව යටතේ ජනමාධ්‍යවේදියෙකු අත්අඩංගුවේ රඳවා තබා ගැණිනි. එමෙන්ම, වවුනියාව පුරවැසි කමිටුවේ ප්‍රධානියාව ත්‍රස්ත විමර්ශන ඒකක්කයට කැඳවන ලද අතර, මහියංගනයේදී වටරැක විජිත හිමියන් තමා ජීවත් වන ප්‍රදේශයේ ගොවියන් මුහුණ දෙන ගැටළු පිළිබඳ පෙත්සමක් ජනාධිපතිවරයා වෙත භාර දීමට යන අවස්ථාවේදී පොලීසියේ හිරිහැර වලට මුහුණ දුන්නේය.

පෞද්ගලික රූපවාහිනී නාලිකා දෙකක් අනවසරෙන් ඇතුළු වීම සහ පහර දීම යන චෝදනා එකිනෙකා වෙත එල්ල කර ගත්හ. ශ්‍රී ලංකාවේ යුධ අපරාධ පිළිබඳ බ්‍රිතාන්‍යයේ චැනල් 4 නාලිකාව විසින් නිෂ්පාදනය කළ වාර්තාමය චිත්‍රපටයට තොරතුරු ලබා දීම යන චෝදනාව යටතේ පුද්ගලයන් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගන්න ලද අතර ඔවුන් සතු වූ උපකරණ රජයේ භාරයට ගෙන ඇත. අත්අඩංගුවට ගත් එක් පුද්ගලයෙකුට විදේශ ගත වීම තහනම් කර ඇත. රජයේ ඉඩම් තනි පුද්ගලයන් විසින් විකිණීමට ගන්නා උත්සහයක් පිළිබඳ පල වූ පුවතක් සම්බන්ධයෙන් පුත්තලමේදී ජනමාධ්‍යවේදියෙකුට පහර දී ඇති බව වාර්තා විය.

චෝදනා විරහිතව රැඳවුම් භාරයේ සිටි මානව හිමිකම් ක්‍රියාකාරිනියක් වන බාලේන්ද්‍රන් ජයකුමාරි මාර්තු 10 වන දින සිට නිදහස් කරන ලද්දේ විදේශ ගත වීම තහනම් කරන නියෝගයක් සමගිනි. එමෙනෙම් සෑම මසකදීම පොලීසියට වාර්තා කරල ලෙස ඇයට දැනුම් දී තිබුණි. ඇයට විරුද්දව ඇති චෝදනා විමර්ශන තව දුරටත් සිදුවේ. මානව හිමිකම් ආරක්ෂකයෙකු වන රුකී ප්‍රනාන්දුට පනවා තිබුණු විදේශ ගත වීම පිළිබඳ වූ සීමා තවදුරටත් බල පැවැත්වෙන අතර ඔහුට විරුද්ධව වූ චෝදනා පිළිබඳ විමර්ශන තව දුරටත් පැවැත් වේ.

**1.** ආරක්ෂක හමුදා විසින් බ්‍රිතාන්‍ය අමාත්‍ය වරයා සමග කතා බහ නොකරන ලෙසට අවතැන් වූ පුද්ගලයන්ට තර්ජනය කරයි.

ජනවාරි 28 වන දින සිවතම්බපිලෛ සුහසාධන මධ්‍යස්ථානය වෙත පැමිණි සිවිල් ඇඳුමින් සැරසුණු ශ්‍රී ලංකා ආරකෂක හමුදාවේ සාමාජිකයන් විසින් සංචාරයක් සඳහා පැමිණි බ්‍රිතාන්‍ය විදේශ කටයුතු සහ පොදු රාජ්‍ය මණ්ඩල කාර්යාල භාර ආමාත්‍ය හියුගෝ ස්වයර් මහතා සමග ඔවුන්ගේ තත්ත්වය පිළිබඳ කතා බහ නොකරන මෙන් යාපනයෙ වලිකාමම් ප්‍රදේශයේ පදිංචිකරුවන් වෙත අනතුරු හගවා ඇත. "ඔබලා දැනට ජීවත් වෙන ඉඩම් ඔබලාට අවශ්‍ය බව පමණක් ඔහු හා පවසන්න. ඒ වෙනුවට අධි ආරක්ෂිත කළාපයේ ඇති ඉඩම් ඔබලාට අවශ්‍ය බව කියන්න එපා." ලෙස පැවසූ බව ආරක්ෂක හමුදා සාමාජිකයෙක් උපුටා දක්වමින් කදවුරේ පදිංචිකරුවෙක් පැවසී.

http://www.tamilguardian.com/article.asp?articleid=13596

**2.** දිනපතා දෙමළ පුවත්පතක් බෙදාහරින්නෙකුට ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවේ නිධාරීන්ගෙන් මරණ තර්ජන

“මේ පත්තරේ තව දුරටත් බෙදා හැරියොත් පත්තරෙත් එක්ක තමාවත් අළු කරනවා” යනුවෙන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ බුද්ධි අංශ භට පිරිසක් විසින් දෙමල ජාතික ජනතා පෙරමුණට සහය දෙන දිනපතා දෙමල බසින් පල වන පුවත්පතක් වන ඉතු නම් තේසාම් හි බෙදාහරින්නා වෙත දැනුම් දී තිබුණි.මාර්තු 10 වන දින කිලිනොච්චියේ නිවනාකර් ප්‍රෙද්ශයේදී බුද්ධි අංශ නිලධාරීන් තිදෙනෙකු මෝටර් රථ දෙකක නැගී අදාල පුවත් පතේ බෙදාහරින්නාව ලුහුබැද ඇත. වෙනත් සිවිල් වැසියන් නොසිටි පාළු ස්ථානයකදී බුද්ධි අංශ නිලධාරීන් විසින් මොහුව නවත්වා ඔහු සතුව තිබූ පුවත්පත් ඔවුන්ගේ භාරයට ගෙන මරණ තර්ජන එල්ල කර ඇති බව පුවත් පත් බෙදා හරින්නා විසින් මාධ්‍යයට ප්‍රකාශ කර ඇත. ආරක්ෂ හේතූන් මත අනන්‍යතාවය හෙළි කිරීමෙන් ඔහු වැළකී සිටියේය.

https://www.tamilnet.com/art.html?catid=13&artid=37687

**3.** උතුරේ දෙමල ජනමාධ්‍යවේදීන් තිදෙනෙකුට බිය වැද්දවීම්



අප්‍රේල් 07 වන දින පොලිස් නිලධාරීන් විසින් යාපනයේ මාධ්‍යවේදීන් තිදෙනෙකුව බිය වද්දා ඇත. තිනකුරල් දිනපතා පුවත් පතේ ටී. විනෝජිත්, කොළඹ කේන්ද්‍රීය ජනමාධ්‍යවේදියෙකු වන ටී. පිර්ගදීපන් සහ නිදහස් ජනමාධ්‍යවේදියෙකු වන මජෝරාපිරියන් යන අයව පොලිස් නිල ඇඳුම් ඇඳගත් මත් පැන් පානය කර සිටි නිලධාරීන් දෙදෙනෙකු විසින් නවත්වා ඔවුන්ගේ ජනමාධ්‍ය හැඳුනුම්පත් පෙන්වන ලෙස පවසා ඇත. මෙම ජනමාධ්‍යවේදීන් විසින් පොලිස් නිලධාරීන්ගෙන් ප්‍රශ්ණයක් ඇසූ විට ඔවුන්ට පිහියක් පෙන්වා ඇති අතර ජනමාධ්‍යවේදීන් යාපනය පොලිස් ස්ථානය ට යන තෙක්ම ඔවුන් පසුපස හඹා ගොස් ඇත.
http://www.ifj.org/nc/news-single-view/backpid/1/article/sri-lanka-police-in-jaffna-criticised-for-arrest-and-intimidation-of-journalists/

### 4. අසත්‍ය තොරතුරු සහිත ලිපියක් ලියූ බවට චෝදනා කරමින් දෙමල ජනමාධ්‍යවේදියෙක් අත්අඩංගුවට

යාපනයේ නෙල්ලියාඩි පොලිස් ස්ථානයේදී ගැහැණු ළමයෙකුට පහර දීමේ සිදුවීමක් පිළිබඳ ලියූ ප්‍රවෘත්තියක් මත උදයන් පුවත්පතේ නිදහස් මාධ්‍යවේදියෙකු වන එන්. ලෝගතායලන් අප්‍රේල් 08 වන දින තෙක් රුඳවුම් භාරයට පත් කෙරුණි. "මූලාශ්‍රය නොදක්වා පුවත්පතක් සඳහා අසත්‍ය තොරතුරු ලබා දීම" යන චෝදනාව මොහුට විරුද්ධව පවරා තිබූ අතර පසුව ඇප පිට නිදහස් කර ඇත. බොහෝ ප්‍රවෘත්ති අසත්‍ය හෝ වැරදි ඒවා ලෙස සැලකුවත්, සාවද්‍ය ප්‍රවෘත්තියක් මත ජනමාධ්‍යවේදියෙකු අත්අඩංගුවට ගැනීමක් මීට පෙර කිසිම අවස්ථාවක සිදුවී නැති බව ජ්‍යෝෂ්ට මාධ්‍යවේදියෙකු ප්‍රකාශ කළේය.
https://cpj.org/2015/04/journalist-faces-charges-after-publishing-report-c.php

### 5. රාජපක්ෂ ආධාරකරුවන්ගෙන් පත්‍රිකා බෙදා හැරීමට බාධා, ක්‍රියාකාරීන්ට ප්‍රහාර



පහරදීමෙන් කළ්‍යානන්ද පෙරේරා තුවාල ලැබිය ( ඡායාරූපය-LNW)

ජාතික නිදහස් පෙරමුණේ සාමාජිකයන් විසින් පත්‍රිකා බෙදා හරිමින් සිටි ප්‍රජාතන්ත්‍රවාදී ජනතා මණ්ඩපයේ සිවිල් සහ දේශපාලන ක්‍රියාකාරීන් පිරිසකට පහර දී ඇත. 'යක්ෂාගමනයට පෙර විමල් වීරවංසට සහ වාසුදේවට

ප්‍රශ්ණ 10ක්' යන හිසින් යුක්ත වූ මෙම පත්‍රිකාව පෙබරවාරි 19 වන දින හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට සහය පළ කරමින් පැවති රැලියක් අතරතුර නුගේගෝඩ මං සන්ධියේදී බෙදා හරිමින් සිටියෙදී මෙම පහර දීම සිදු වී ඇත. පත්‍රිකා බෙදමින් සිටි කණ්ඩායමේ කල්‍යානන්ද පෙරේරා මහතා පහර දීමෙන් තුවාල ලැබූ අතර මිරිහාන පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ගොනු කර ඇත. ප්‍රහාරය එල්ල කළ පිරිස අතරින් දෙදෙනෙකු අත්අඩංගුවට ගනු ලැබූ නමත් ඒ පිළිබඳ නඩුවක් ගොනු කර නොමැත.

http://ceylontoday.lk/51-85177-news-detail-civil-activists-accuse-nff-of-assault.html & http://lankanewsweb.net/news/10068-kalyananda-perera-accuse-wimal-weerawansa-for-hindering-the-democratic-people-s-forum

### 6. එක් රූපවාහිනී කණ්ඩායමක් තවත් රූපවාහිනී කණ්ඩයමක් විසින් රදවාගෙන හිරිහැර කළ බවට චෝදනා

පළ කරන ලද ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා අද දෙරණ රූපවාහිනී නාලිකාව වෙත ගිය සිරස ටීවී හි මාධ්‍යවේදීන් කණ්ඩායමක් රදවාගෙන, පහර දී බිය ගන්වා ඔවුන්ගේ කැමරා ආම්පන්න අත් පත් කර ගත් බව MTV/MBC මාධ්‍ය ජාලය චෝදනා කළ බව මාධ්‍යයට වාර්තා විය. MTV/MBC මාධ්‍ය ජාලයේ මාධ්‍යවේදීන් නීති විරෝධීව සිය ආයතනය පැමිණ ඇති බව අද දෙරණ ප්‍රකාශ කළේය. මරදානේ ඇති මාධ්‍ය ආයතනය ප්‍රකාශ කරන අන්දමට අවසර නොමැතිව මාධ්‍යවේදීන් තිදෙනෙක් ඔවුන්ගේ ආයතනයට ඇතුල් වී ඇති බව සහ එම චෝදනාව නිවැරදි නම් එසේ අවසර නොමැතිව ඇතුළු වීම වරදක් බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශක සහකාර පොලිස් අධිකාරී රුවන් ගුණසේකර මාධ්‍යයට පැවසීය. "අනෙක් අතට, මරදානේ පිහිටි ආයතනයේ සේවකයන් විසින් පැමිණි මාධ්‍යවේදීන්ට පහර දීමද වරදක් බව ඔහු තව දුරටත් කියා සිටියේය. (මරදානේ පිහිටි ආයතනය යනුවෙන් සඳහන් වන්නේ ටීවී දෙරණ ආයතනයයි.)

http://www.dailynews.lk/?q=local/sirasa-vs-derana

### 7. චෝදනා රහිතව දින 362ක් රැඳවුම් භාරයේ සිට නිදහස් වූ මානව හිමිකම් ක්‍රියාකාරිනිය ට අධිකරණය සීමා පනවයි.




රැඳවුම් භාරයෙන් නිදහස් වූ ජයකුමාරි (ඡායාරූපය: @RadeepG)

දින 362ක් චෝදනා රහිතව රැඳවුම් භාරයේ සිටි බාලේන්ද්‍රන් ජයකුමාරි මහත්මිය 2015 මාර්තු 10 වන දින නිදහස් කරන ලද නමුත් සෑම මසකම පොලීසියට වාර්තා කරන මෙන් සහ විදේශ ගතවීම තහනම් කරමින් අධිකරණය ඇය වෙත සීමා පනවන ලදී. ඇය පිළිබඳ පරීක්ෂණ තව දුරටත් පැවැත්වේ. ඇය 2009 වසරේදී ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත භාර දීමෙන් අනතුරුව අතුරුදහන් වී ඇති සිය පුත්‍රයා ඇතුළු අතුරුදහන් වූ පුද්ගලයන් වෙනුවෙන් සත්‍ය සහ යුක්තිය ඉටු කරවා ගැනීම වෙනුවෙන් කටයුතු කළ ප්‍රමුඛ පෙළේ ක්‍රියාකාරිනියකි.
https://freejeyakumary.wordpress.com/2015/03/10/jeyakumary-and-9-other-political-prisoners-released-today/

### 8. චැනල් 4 වෙත සහය පළ කළැයි විදේශ ගමන් බලපත්‍රය අත් හිටුවයි

ශ්‍රී ලංකා රජයට සහ ආරක්ෂක හමුදාවන්ට අපහාස වන ආකාරයේ චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීම සඳහා බ්‍රිතාන්‍යයේ චැනල් 4 රූපවාහිනී නාලිකාවට සහය දුන් බවට ඇති චෝදනාවක් මත, කොළඹ මහේස්ත්‍රාත්වරයා විසින් රමනාදන් අගිනම් යන අයට විදේශ ගත වීම වළක්වාලන නියෝගයක් නිකුත් කරන ලදී. ඔහුගේ පරිගණකය සහ සෙසු තාක්ෂණික උපකරණ පරීක්ෂා කර බැලීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය වෙත යැවීමට මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කර ඇත. චැනල් 4 නාලිකාව වෙත තොරතුරු ලබා දීම සඳහා රමනාතන් වෙත සහය ලබා දුන් බවට සැක කෙරෙන තවත් පුද්ගලයන් කිහිපදෙනෙක්ම හඳුනා ගෙන ඇති බව බොරැල්ල පොලීසිය ප්‍රකාශ කළේය. මේ පිළිබඳ කෙරෙන පරීක්ෂණ තවමත් අවසන් නොමැති බැවින් මොහු රටින් පිටවීම වැලැක්වීමට අවශ්‍ය වූ බව පොලීසිය කියා සිටියේය.
http://www.dinamina.lk/2015/03/31/_art.asp?fn=n15033124


### 9. සැක සහිත ගනුදෙනුවක් යට ගැසීමට මාධ්‍යවේදියෙකුට පහරදෙයි



නීති විරෝධී ඉඩම් ගනුදෙනුවක් පිළිබඳ වාර්තා කිරීම නවතා දැමීමට පුත්තලම මාධ්‍යවේදී හිරාන් ප්‍රියංකර ජයසිංහ මහතාට නාඳුනන පුද්ගලයෙකු විසින් පහර දී ඇත. මාර්තු 23 වන දින පුත්තලම පාලවිය ප්‍රදේශයේදී මෙම සිදුවීම හටගෙන ඇත. ප්‍රහාරයට මුහුණ දුන් ජයසිංහ මහතා ප්‍රතිකාර සඳහා පුත්තලම රෝහලට ඇතුළත් කර ඇත. රජයේ ඉඩම් නීති විරෝධීව විකිණීමට උත්සහ දරන පුද්ගලයෙකු විසින් තමාට පහර දුන් බව ජයසිංහ මහතා මාධ්‍යයට කියා සිටියේය. මෙම සිදුවීම් සම්බන්ධයෙන් පුත්තලම පොලීසියේ පැමිණිල්ලක් ගොනු කර ඇත.
Ada Derana / http://goo.gl/qn5vqd

මාධ්‍යවේදී හිරාන් ප්‍රියංකර ජයසිංහ ( ඡායාරූපය: ජුඩ් සමන්ත )

**10.** වවුනියාව පුරවැසි කමිටුවේ ප්‍රධානියා ත්‍රස්ත විමර්ශනයට කැඳවයි



ක්‍රිෂ්ණපිලෛ දේවරාසා (ඡායාරූපය: Sri Lanka Mirror)

වවුනියාව පුරවැසි කමිටුවේ ප්‍රධානී ක්‍රිෂ්ණපිලෛ දේවරාසා මහතාවට මාර්තු 26 වන දින පොලිස් ත්‍රස්ත විමර්ශන ඒකකයට පැමිණෙන ලෙස දන්වා තිබුණි. මොහු උතුරේ සහ නැගෙනහිර පළාතේ පුද්ගලයන් අතුරුදහන් වීම පිළිබඳ වවුනියාව ඇතුළු ප්‍රදේශ කිහිපයක මෑතකදී පැවති විරෝධතා මාලාවේ ප්‍රධාන සංවිධායකයෙකු විය. පසුගිය වසරේ දී ද පහරදීමකට ලක් වීම හේතුවෙන් දේවරාසා මහතා රෝහල ගත කර තිබුණි.

http://www.srilankamirror.com/news/item/3105-vavuniya-citizen-s-committee-head-to-tid

**11.** ඝාතනය කෙරුණු ජනමාධ්‍යවේදියෙකු වන රිචඩ් ද සොයිසා පිළිබඳ නිර්මාණය වූ චිත්‍රපටයක් අත්හිටුවයි.

ජනමාධ්‍යවේදී රිචඩ් ද සොයිසා පිළිබඳ නිර්මාණය වීමට නියමිතව තිබූ චිත්‍රපටයේ අධ්‍යක්ෂවරයා වෙත ලිපියක් යවමින් ආරක්ෂක අමාත්‍යාංශය දන්වා තිබුණේ චිත්‍රපටය රූ ගත කිරීමට අවසර දිය නොහැකි බවයි. අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතුව ලෙස අප්‍රසන්න අතීතය සිහිපත් කිරීම නුසුදුසු බව ලිපියේ දක්වා තිබූ බව පොලිසිපතිවරයා උපුටා දක්වන වාර්තා සඳහන් කළේය. මාධ්‍ය වේදී රිචඩ් ද සොයිසා 1990 පෙබරවාර් 18 වන දින රාජගිරියේ වැලිකඩවත්ත සිය නිවසේදී සිවිල් ඇඳුමින් සැරසුණු ආරක්ෂක භටයින් විසින් පැහැර ගනු ලැබුණි. පසු දා උදෑසන කෲර වද හිංසා දී මරා දැමුණු ඔහුගේ සිරුර මොරටුව කොරලවැල්ල මුහුදු වෙරළේදී සොයා ගැණුනි. ඔහුගේ මව වූ වෛද්‍යා මනෝරානී සරවනමුත්තු මහත්මිය විසින් ආරම්භ කළ අරගලය වටා මෙම චිත්‍රපටය සකස් වී ඇත. අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳව එක්ව කටයුතු කිරීම සඳහා මවුවරුන්ගේ පෙරමුණු ආරම්භ කළේ

ඇය විසිනි. ඔහුගේ ඝාතනයේ චූදිතයන් ඝාතනයෙන් වසර 15කින් පසු එනම්, 2005දී කොළඹ මහාධිකරණය විසින් නිදහස් කරන ලදී.

http://english.srilankamirror.com/entertainment-mirror/item/2725-police-prohibits-film-on-richard-de-zoysa

### 12. මානව හිමිකම් ආරක්ෂකයෙකු වෙත පනවා තිබූ සීමා ඉවත් කිරීම ප්‍රතික්ෂේප වේ




රුකී ප්‍රනාන්දු 2015 මාර්තු මාසයේදී UNHRC කණ්ඩායම් හමුවක් අමතමින්

මානව හිමිකම් ආරක්ෂකයෙකු වන රුකී ප්‍රනාන්දු මහතා වෙත නිදහසේ අදහස් ප්‍රකාශ කිරීම සහ විදේශ ගතවීම පිළිබඳ සීමා පනවා 2015 මාර්තු 21 වන දිනට වසරක් ගත විය. රුකී ප්‍රනාන්දු කොළඹ පිහිටි INFORM (මානව හිමිකම් දත්ත කේන්තද්‍රෙය් ) හි උපදේශකවරයෙකි. ත්‍රස්ත විමර්ශන ඒකකයේ ඉල්ලීමක් අනුව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය විසින් මෙම සීමා පනවන ලදී. එවැනිම තවත් නියෝගයක් මගින් ඔහු සතුව තිබූ ඉලෙක්ට්‍රොනික උපකරණ රජයේ භාරයට ගන්නා ලදී. 2014 නොවැම්බර් 05 වන දි ඔහුගේ නීතීඥවරයා විසින් ඔහුට එල්ල වී ඇති චෝදනා වලින් නිදහස් කරන ලෙස සහ ඔහු වෙත පනවා ඇති සීමා ඉවත් කරන ලෙස නීතිපතිවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළේය. නිදහසේ විදේශ ගත වීම පිළිබද වූ සීමා ඉවත් කිරීමේ හැකියාවක් ඇති බව පෙනුනත් විමර්ශනය දිගටම ක්‍රියාත්මක වන නිසා රජය භාරයට ගත් ඉලෙක්ට්‍රොනික උපකරණ ආපසු ලබා දි නොහැකි බවත් අදහස් ප්‍රකාශ කිරීම පිළිබද පනවා ඇති සීමා ඉවත් කළ නොහැකි බවත් ඔහුගේ නීතීඥවරයා වෙත නීතිපති වරයා විසින් දැනුම් දී ඇත.

### 13. පොලීසියට විරුද්ධව විරෝධතාවයේ නිරත වූවන්ට කදුළු ගෑස් ප්‍රහාර

පෙබරවාරි 1 වන දා තලවකැලේ පොලිස් ස්ථානය ඉදිරිපිටදී විරෝධතාවයක නිරත වූ පිරිසක් විසුරුවා හැරීමට පොලීසිය විසින් කදුළු ගෑස් ප්‍රහාර යොදා ගෙන ඇති බව අද දෙරණ වාර්තා කළේය. ජනවාරි

31 වන දින තලවකැලේ පොලීසිය තුළදී අත්අඩංගුවේ සිටි පුද්ගයෙකු සැක කටයුතු ලෙස මිය යාම මෙම විරෝධාතවට හේතු වී ඇත. කෙසේ වෙතත් කඳුළු ගෑස් ප්‍රහාර එල්ල බවට එල්ල චෝදනාව පොලීසිය විසින් ප්‍රතික්ෂේප කර ඇත.

http://www.adaderana.lk/news/29650/talawakelle-demonstrators-call-off-protest&



විරෝධතාකරුවන් නිසා  උඩරට දුම්රිය මාර්ගය පැය කිහිපයකට අවහිර විය. (ඡායාරූපය: Ada Derana)

**14.** විශ්ව විද්‍යාල ශිෂයන්ගේ විරෝධතා ව්‍යාපාරයකට පෙලීසියෙන් ප්‍රහාර

මාර්තු 31 වන දින පැවැත්වුණු විරෝධතා පාගමනට පහර දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසියට සහ පොලිස් විශේෂ කාර්ය බලකායට විරුද්ධව මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට සූදානමින් සිටින බව අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයට ප්‍රකාශ කළේය. මෙම පහරදීමේදී විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් 24 දෙනෙකු තුවාල ලැබූ බවත්, හිසට සහ දෙපා වලට බැටන් පොලු වලින් එල්ල කළ ප්‍රහාර නිසා ලැබූ දරුණු තුවාල හේතුවෙන් ඉන් 10 දෙනෙකු රෝහල් ගත කළ බවද අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය කියා සිටියේය. මෙම සිදුවීම් පිළිබඳ විශේෂ ප්‍රකාශයක් මාධ්‍යයට නිකුත් කරමින් අග්‍රාමාත්‍ය කාර්යාලය ප්‍රකාශ කර සිටියේ, “මෙවැනි සිදුවීම් සිදුවීම ඉතාම කණගාටුදායකයි. විරෝධාතාකරුවන් සාමකාමීව, ඔවුන්ගේ නියෝජිතයන්ට අපගේ ආරාධනය පිළිගෙන ඔවුන්ගේ සංදේශය භාර දීමට  ඉඩ දුන්නා නම් මෙම කණගාටුදායක සිදුවීම සිදු වන්නේ නැහැ” යනුවෙනි.  “අගමැතිවරයාට ඔවුන් සංදේශය භාරදීමේ අවශ්‍යතාවය පිළිබඳ  අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය විසින් කිසිදු පූර්ව දැනුම් දීමක් සිදු කර නැහැ. ඔවුන් දැනුම්දී තිබෙන්නේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත සංදේශය භාර දීමට පාගමනේ ගමන් කරන බව පමණි” යනුවෙන් තව දුරටත් එම ප්‍රකාශයේ සඳහන් විය.

http://www.ceylontoday.lk/51-89025-news-detail-iusf-to-go-to-hrcsl.html

## **15.** මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරී හිමි නමකට පොලීසියෙන් හිරිහැර

තම ගම් ප්‍රදේශයේ ජනතාව මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳ පෙත්සමක් ජනාධිපතිවරයා වෙත භාර දීමට ගිය අවස්ථාවේ තමාව පොලීසියේ රඳවා ගෙන හිරිහැර කළ බව වටරැක විජිත හිමි විසින් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත ඉදිරිපත් කළ ලිපියක් මගින් පැමිණිළි කර ඇත. මීළග මං සන්ධියේදී තමාව ඝාතනය කිරීමට පුද්ගලයන් 6 දෙනෙකු සිටින බව පවසමින් මහියංගනයේ හබර වැව මං සන්ධියේදී පොලිස් නිලධාරීන් 15 දෙනෙකුගෙන් පමණ යුතු කණ්ඩායමක් තමාගේ ගමන නතර කළ බව විජිත හිමි විසින් එම ලිපියේ සඳහන් කර ඇත. අදාල හිමිනම සතුව තිබූ ජංගම දුරකතනය පොලීසියේ භාරයට ගෙන හිමිනම ගිරාදුරුකෝට්ටේ පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඇත. ලිපියේ සඳහන් වන ආකාරයට අදාල සිදුවීම සිදුවී ඇත්තේ මාර්තු 21 වන දිනය. විජිත හිමි, ආගම් අතර සහජීවනප නංවා ලීම සහ බෞද්ධ නොවන ප්‍රජාවන් ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ විශේෂයෙන්ම, පසුගිය කාලයේ ප්‍රචණ්ඩත්වයට මුහුණ දුන් මුස්ලිම් සහ ක්‍රිස්තියානි ප්‍රජාවන් ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන්, බෞද්ධ ප්‍රජාව අතර ප්‍රභල හඬක් නැංවූ හිමි නමකි. විජිත හිමියන් 2013 අගෝස්තු මාසයේ සිට විවිධ අවස්ථා වලදී පහරදීම්, තර්ජනය කිරීම් සහ බිය වැද්දවීම් වලට මුහුණ දී ඇති අතර ඔහු විසින් සංවිධානය කරන ලද මාධ්‍ය සාකච්ඡාවක් පොලීස් නිලධාරීන් ඉදිරියේදීමය කිසියම් කණ්ඩයමක් විසින් කඩාකප්පල් කරන ලදී. මෙම කඩාකල්පල් කිරීම පිළිබඳව පැහැදිළි සාක්ෂි ඉදිරිපත් වී තිබුණද මේ වන විටත් ඒ සම්බන්ධයෙන් කිසිදු පුද්ගලයෙක් අත්අඩංගුවට ගෙන නොමැත.

http://goo.gl/eVzxG4